CORGI Registered Central Heating Engineer
Reliable, friendly. Any work not too small
කුඩා හෝ මහා පරිමාණයේ හෝ ඕනෑම
සෙන්ට්‍රල් හීටිං කාර්යයක් සඳහා විමසන්න.
දක්ෂ, එමෙන්ම විශ්වාසවන්ත සේවය
නාමල් Namal - 0 7 9 5 8 7 2 0 9 1 2

Domestic Part P & BS7671 Qualified
Professional Electrical Engineer
All electrical work carried out
Testing-Inspecting and Certification of all work
All jobs undertaken with guarentee
ගෘහස්ත සියළු විදුලි කාර්මික කටයුතු සඳහා
ප්‍රවීන විදුලි ඉන්ජිනේරු ශිල්පී සේවය
Call - රන්ජිත් Ranjith on 07904174241

ලිහිණියා LIHINIYA
ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල
වසර 20 ක අඛණ්ඩ මිත්‍රශීලී සේවය
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.
Tel. 0 2 0 8 4 5 0 9 0 5 2
66 Cricklewood Broadway, London NW2 3EP

UK IMMIGRATION SERVICES
Points Based System - Tiers 1 2 4 & 5
Indefinite Leave to Remain,
Naturalisation, Marriage,
Elderly Dependents, Domestic workers,
Out of rules applications (overstays)
UK Immigration Appeals
*Please call for appointment*
Colvin L. De Silva
Accredited Immigration Advisor
Tel. 020 8906 3747 Mobile 07956 502019

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට
වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි
සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ
♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 4 4 8 2 7 0 / 4 3 2 2 3 6
♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල
සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක්
ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.
දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.
TRICO
Shipping & Forwarding Ltd
555 White Hart Lane
London N17 7RP
Telephone 0 2 0 8 8 8 8 8 7 8 7
Fax 0 2 0 8 8 8 9 5 4 4 5
E-Mail : trico@tricoshipping.com
නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය



## වැරදි නිවැරදි කිරීම

මරදාන ප්‍රදේශයේ පදිංචි මුස්ලිම් ජාතිකයෙක් පොඩි නඩුවකට පැටලී අළුත්කඩේ උසාවියට පැමිණ සිටියේය. ඔහුගේ නඩුව ඇසීම ඇරඹෙත්ම විත්තිකූඩුවට නැගගත් ඔහුගෙන් විනිශ්චය කාරවරයා මුලින්ම මෙසේ ඇසීය.

" යුෂ්මතා වැරදිකරුද.... නිවැරදිකරුද...? "

තමාගේ නම ආමන්ත්‍රණය කිරීමේදී නඩුකාර යාට ලොකු වැරැද්දක් සිදුව ඇතැයි සිතූ මුස්ලිම් ජාතිකයා මෙසේ කීවේය.

" ස්වාමීනි මම යුෂ්මතා නෙවෙයි.. මුස්තාපා! "

## පළතුරුවල ගුණ

**ගුරුතුමිය :** ළමයි..... අද අපි ඉගෙන ගන්න යන්නෙ පළතුරු කෑම ගැන.....පළතුරු ශරීරයට හරි ගුණ දෙයක්...... ඒ නිසා මම ඔය ගොල්ලන්ටත් කියන්නෙ පුළුවන් තරම් පළතුරු කන්න..... පළතුරු කෑවම ලස්සන වෙනවා..... ඇඟ රන්වන් පාට වෙනවා.....

**ඇම්ඩන් :** අනේ මොන බොරුද මිස්..... උපන්දා හිටන් පළතුරු කන වවුල්ලු එකෙක්වත් ඉන්නවද රත්තරන් පාට...? උන් ලස්සනද.....?

## බයගුල්ලා

දිවසක් සත්තු වත්තේ මුරකරු වන ජේම්ස් බලන්නට යාළුවෙක් ආවේය. ඔහු ළඟ අරක්කු බෝතලයක්ද විය. දෙදෙනාම එය ඉවර කළෝ ය. යාළුවා යන්නට ගිය පසු ජේම්ස්ගේ ඔලුව කරකැවෙන්නට විය. තද නිදිමතක්ද දැනිණ. එය වැඩ නිමාවී ගෙදර යන වෙලාව වුනත් වෙරි හිඳෙන කල් ගෙදර යන්නටද බැරිය. ඇල වෙන්නට සුදුසු ස්ථානයක් සොයා ගන්නට බැරි වූ නිසා අන්තිමේදී මොනවා වුනත් කමක් නැතැයි සිතූ ජේම්ස් සිංහයාගේ කූඩුවට වැදී නිදාගන්නට විය.

තම සැමියා වැඩ ඇරිලාත් ගෙදර නාවේ මොකදැයි බලන්නට ජේම්ස්ගේ බිරිඳ ඇසිලින් සත්තු වත්තට ආවේය. සිංහ කූඩුවේ සැපට නිදාගෙන ඉන්නා තම සැමියා දෙස බැලූ ඇසිලින් මෙසේ කියා යන්නට ගියා ය.

" නොදකින් බයගුල්ලා.... බීලා ගෙදර එන්න බයේ සිංහ කූඩුවට වෙලා නිදි...."

## වම්බොටු

දිනක් රජතුමා සහ අන්දරේ ගමනක් යමින් සිටියේය. අතර මගදී හේනක වම්බොටු වගාවක් දුටු රජතුමා මෙසේ කීවේය.

**රජතුමා :** අන්දරේ වම්බොටු කියන්නෙ මරු එළවළුවක් නේද....?

**අන්දරේ :** මේ මොනව කියනවද රජතුමනි... වම්බොටු කියන්නෙ ලෝකෙ තියෙන හොඳම එළවළු ජාතියක් නේ... ෂහ්...! කියලා වැඩක් නෑ..... මරු....!

සතියකට පසු නැවතත් රජතුමා සහ අන්දරේ ඉහතකී වම්බටු හේන ළඟින් ගමන්කරමින් සිටියහ.

**රජතුමා :** අන්දරේ තමුසෙ දන්නවද.... මට එපාම කරපු කෑමක් නේ මේ වම්බටු....!

**අන්දරේ :** හා...පෝ...! මතක් කරන්ඩ එපා රජතුමනි.... ඔය වම්බටු කියන්නෙ ගෙයි හතර මායිමට ගන්න හොඳ ජාතියක් නෙවෙයි....

**රජතුමා :** ඈ බං....? දැන් මේ ගිය සුමානෙ මම කිව්වම වම්බටු හොඳ කෑමක් කියලා.... උඹම කිව්වා නේද වම්බටු නියම කෑමක් කියලා....?

**අන්දරේ :** මේක නේ රජතුමනි..... මම සේවය කරන්නෙ ඔබ වහන්සෙට මිසක්.... වම්බටු වලට නෙවෙයි නේ....!

## බයවිය යුතු කාරණයක්!

මේ ළඟදී මට මෙසේ සිතුණි. හරි නම් අප කවුරුත් ඇඳක නිදාගන්නට බය විය යුතුය. කර ඇති සමීක්ෂණ වලට අනුව මේ ලෝකයේ ජනගහනයෙන් 99% ක්ම මිය යන්නේ ඇඳන් වලය.

Community Legal Service

ANTONS
SOLICITORS
Community Legal Service
For Quality Services
We offer a comprehensive range of Legal Services.

Conveyancing
- Sale & Purchase
- Right to buy (Council House)
- Re-Mortgage
- Assignment of Lease
- New Lease
- Licensing Applications
- Contractual Disputes

Immigration
- Asylum cases
- Asylum Application
- Judicial Reviews
- Extensions of Visas
- Marriage Applications
- Work Permits
- Business Visas

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

*Contact -* Mrs Rani Bulathwela 0 7 8 0 8 1 5 8 3 6 0
Vajira – 0 7 8 8 7 8 4 0 2 2 7

ANTONS SOLICITORS
14 Wordsworth House, Wordsworth Parade
London N8 0SJ
Tel. 0208 888 6211 Fax 0208 888 1403

ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත. ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 11 ක චෙක්පතක් *Lanka Viththi* යනුවෙන් ලියා පහත ලිපිනයට එවන්න.
Lanka Viththi, P. O. Box 64678, London NW3 9LS

## No food or water for 70 years!
## කෑම වතුර නැතුව අවුරුදු 70 ක්!



ඉන්දියාවේ අහමදබාද්හි වෙසෙන යෝගාවචරයෙක් පුරා අවුරුදු **70** ක් කෑම හෝ වතුර නොගෙන තවමත් හොඳ ශරීර සනීපයෙන් සිටින පුවතක් ගිය මාසයේ අග ලොව පුරා ප්‍රවෘත්ති වල අසන්නට ලැබිණ. වයස අවුරුදු **82** ක් වන ඔහුගේ නම ප්‍රහලාද් ජානි ය. මෙය ඉතාමත් පුදුම කාරණයක් බවත්, කෑම වතුර නැතිව දින කීපයකින් කෙනෙකු මියයෑම සාමාන්‍ය පිළිගැනීම බැවින් මෙය කිසිසේත් විය නොහැකි දෙයක් බවත්, මෙය මේ යෝගියාගේ අමු ප්‍රෝඩාවක් බවත් ඇතැම් අය සැක පහළ කරති. එහෙත් ඉන්දියාවේ විශේෂඥ වෛද්‍යවරු **30** දෙනෙකුගේ කණ්ඩායමක් ජානි රෝහ ලක නතර කරගෙන කාරණය සැබෑවක්දැයි නිශ්චය කරගැන්මට පරීක්ෂණ දැනට අරඹා ඇත. යෝගියාගේ කාමරය වටා සහ අවට කැමරා සවිකර ඔහුගේ සෑම ඉරියව්වක්ම පටිගත කෙරේ. රෝහලට ගෙනාවාට පසු තවම ඔහු කිසිදු ආහාරයක් හෝ වතුර බිඳක් හෝ ගෙන නැති අතර මේ දක්වා මළ මූත්‍ර කිසිවක් පිටකර නැත. ඔහු ඉතා සනීපයෙන් වෙසෙන බව පමණක් එම වෛද්‍යවරු කියති. ජානි පවසන්නේ තමා භාවනා මාර්ගයෙන් ධ්‍යානයකට සමවැදී සිටින නිසා ආහාර අවශ්‍ය නැති බවය.

ඉන්දියානු ආරක්ෂක අංශයේ නිලධාරීන් බලා සිටින්නේ ජානිගේ මෙම කතාව ඇත්තක් නම් එම රහස සොයා ගතහොත් එය ආරක්ෂක සේනාංකයන්ට දුෂ්කර පරිසරවලදී කෑම වතුර නැතිව සිටින්නට රුකුලක් වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි බවයි. මේ පිළිබඳ වැඩි විස්තර කිසිවක් ඉන්දියාවෙන් ලැබී නැත.

එහෙත් ඉන්දියාවේ යථාර්ථවාදීන්ගේ සංගමය මේ ගැන සැක පහළකරමින් කියන්නේ යම් යම් අවස්ථාවල ජානිට නිදහසේ එහෙ මෙහෙ යෑමට ඉඩදුන් අවස්ථාද ඇති බවයි. ඔව්හු මේ ගැන දැඩි සෙවිල්ලෙන් සිටිති.

An 82-year old holy man named **Prahlad Jani** in Ahmedabad, Gurjarat, India claims not to have had anything to eat or drink for over **70** years. Now to test that claim, over 30 specialists and doctors in India put the holy man to test. The long-haired and bearded yogi is under 24-hour observation in the western Indian city of Ahmedabad. Two cameras have been set up in his room, while a mobile camera films him when he goes outside, guaranteeing round-the-clock observation.

But after six days, Mr Jani appears unaffected by the fact that he has not eaten or drunk anything, or passed any urine or a stool. He remains in good health and is active, according to his doctors.

This is a mystery, and the researchers are still evaluating Jani's situation to learn how the body functions without food.